ප්‍රතිපත්ති සාරාංශය
ප්‍රතිපත්ති සාරාංශය යනු කුමක් ද?

STREAM මගින් ප්‍රකාශිත ප්‍රතිපත්ති සාරාංශ මගින් පර්යේෂණ දත්ත සහ ප්‍රාදේශීය මිනිසුන්ගේ අත්දැකීම් අන් අය සමග හුවමාරු කර ගනී. මේවා මගින් ප්‍රධාන ප්‍රතිපත්තිමය ගැටළු සාකච්ඡා කෙරේ.

මේවා සකසා ඇත්තේ ඉක්මණින් කියවිය හැකි වන පරිදි වන අතර, මාතෘකාවට අදාල ප්‍රධානතම ගැටළු පමණක් සාකච්ඡා කෙරේ. මේවා භාවිතා කිරීම මගින් දිළිඳු ජලජීවී සම්පත් භාවිතා කරන්නන්ට තමුන්ගේ ජීවනෝපාය මාර්ග ගැන වැදගත් තොරතුරු දැනගත හැකි වන අතර, සුදුසු ප්‍රතිපත්ති සැකසීමට ආයතන නිලධාරීන්ට උපකාරී වේ.

ප්‍රතිපත්ති සාරාංශ කවුරුන් සඳහා ද?
ප්‍රතිපත්ති සාරාංශ භාවිතා කරනු ලබන්නේ

- ප්‍රතිපත්ති සාදන්නන්
- ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්නන්
- ප්‍රාදේශීය සංවිධායක වරුන්
- රාජ්‍ය නොවන ආයතන
- රාජ්‍ය ආයතන
- ආධාර කරුවන්
- අනෙකුත් ප්‍රයෝජනවත් පාර්ශවයන්

ප්‍රතිපත්ති සාරාංශ ප්‍රකාශයට පත් කරන්නේ කවුරුන්ද?

ප්‍රතිපත්ති සාරාංශ ගොඩනගනු ලබන්නේ ප්‍රතිපත්ති වලට යටත්ව සිටින ප්‍රාදේශීය ජනතාවය. STREAM ආයතනය මගින් මෙම තොරතුරු එක්රැස් කර සකසා ප්‍රකාශයට පත් කරවන අතර, ඒවා විවිධ භාෂා වලට පරිවර්ථනය කරයි.

මෙම ප්‍රතිපත්ති සාරාංශ සැකසීම Network of Aquaculture Centres in Asia - Pacific (NACA) ආයතනය යටතේ ක්‍රියාත්මක වන Support to Regional Aquatic Resources Management (STREAM) ව්‍යාපෘතිය මගින් සිදු කරයි.

මේවා ලබාගත හැක්කේ කොහෙන් ද?

ස්වදේශීය භාෂාවෙන් ප්‍රකාශිත ප්‍රතිපත්ති සාරාංශ දේශීය STREAM කාර්යාලයෙන් ලබා ගත හැක. වැඩි විස්තර සඳහා

http://www.streaminitiative.org/Library/Policy Brief/index.html >

කුමන විෂයයන්ට අදාල ප්‍රතිපත්ති සාරාංශ ලබාගත හැකි ද?

ප්‍රතිපත්ති සාරාංශ අංක 1: මෙමගින් ඒකමතිකතාවය ගොඩනැගීමේ ක්‍රියාවලිය පිළිබඳව අවධානය යොමු කරයි. එහිදී ගොවියන් සහ ධීවරයන් ප්‍රාදේශීය, දිස්ත්‍රික්ක සහ පළාත් වල පවතින රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සමග පවත්වන සම්බන්ධතාවය හෙළිදරව් කරයි. මෙයට අදාල ව්‍යාපෘතිය වනුයේ බ්‍රිතාන්‍ය ආණ්ඩුව මගින් ආධාර කරනු ලබන DFID Natural Resources Systems Program Project R8100 යන ව්‍යාපෘතියයි.

ප්‍රතිපත්ති සාරාංශ අංක 02 : මෙමගින් ප්‍රාදේශීය ජනතාවගේ ජලජීවී හා ධීවර ක්ෂේත්‍රයන්ට අදාල ජීවනෝපාය මාර්ග ගැන තොරතුරු සාකච්ඡා කරයි. මෙයට අදාල ව්‍යාපෘතිය වනුයේ, FAO Technical Cooperation Project “Assistance in Poverty Alleviation through Improved Aquatic Resources Management in Asia - Pacific” යන ව්‍යාපෘතියයි.